# කිරින්දෙ සිට ඇවිදින් යන බිරින්දගේ සොබනා

**ශෘංගාරය හා සිංහල කවිය**



**සිං**හළ කාව්‍යයෙහි දැක්වෙන විවිධ රසයන් අතර ශාංගාර රසය දනවන කවිවලට විශේෂ තැනක් හිමිවේ. බොහෝ විට ඒවා කාව්‍ය රසිකයින්ගේ සිත් බැඳගන්නේ යොවුන් විය හා එතුණු වැඩිහිටි ගතියක් ද කම්සැපත ස්පර්ශ කෙරෙන සුන්දරත්වයක්ද සැහවී හෝ නොසැහවී ඒ කාව්‍ය යන්හි අඩංගු වන බැවිනි. බොහෝ තන්හිදී යෞවන කාන්තාවන්ගේ අහපසහ වර්ණනා කෙරෙන යෙදුම් ආශ්‍රිතව මෙම ශාංගාර කවි ගෙතී තිබේ. ඉංග්‍රීසියෙන් **Erotic Poetry** යනුවෙන් හඳුන්වන ශාංගාර පද්‍ය පැවත එන්නේ පුරාතනයේ සිට ය. පැරණි ග්‍රීසියේ, රෝමයේ පමණක් නොව චීනයේ සහ ඉන්දියාවේ විසූ ශෘංගාර කවියන්ගේ ප්‍රබන්ධ බොහොමයක්

ඉන්දියාවේ ක්‍රි.ව. 5 වන සිය වසේ විසූ භාර්තෘහරී එවැනි ශාංගාර රසය දනවන කවි ගෙතූ කවියෙකි. ඔහු දාර්ශනිකයෙකු වශයෙන්ද සැලකෙන අතර, ඔහු වරෙක ශ්‍රමණයෙකුගේ ජීවිතයක් ද, වරෙක කෙළි ලොල් ජීවිතයක්ද ගත කළ බව කියැවේ. ඔහුගේ එක් පද්‍යයක් නැසී ගිය ඇමරිකානු ලේඛිකාවක හා කිවිදියක වන

> සුරින්දගේ අහනන් වන - බරින් බිමට බමු සන්දන-
> කිරින්දෙ සිට ඇවිදින් යන - බිරින්දගේ සොබනා........
> රුවින් ඇගේ යසසින් මන - රතින්දගේ ඔද සුන්වන-
> ලෙසින් කියම් එළඳුන් ගැන - සිතින් හැඟෙන පමණා.....
> තදින් තකට දිම් තොන් යන -පෙදෙන් නටන ඇගෙ පුන් තන-
> එරන් තිසර පැටියන් මෙන - නෙතින් නෙතට පෙනුණා......
> මෙවන් අහන මට දැන් ගෙන -විඳින්ට රති සැප දුන් තැන-
> එවුන්ට දෙමි මසුරන් ගැන - රැකෙන්ට මට තිබෙනා........
>
> රුවින් සදිසි සිරි කල් වන - නුවන් යුගැති ඉඳුනිල් වන-
> කුසුම් වරල සිකි පිල් වන - ගනන් අතුස විලසා........
> ලෙවන් අදර වද මල් වන - දසන් පෙළද කොඳ තුල් වන-
> වදන් තියන සුරතල් වන - පෙමින් බලන අමැසා........
> සුපුන් දෙතන සුරතල් වන - පෙදින් පෙදට නිති සොල්වන-
> හොඳින් සළෙලු මන බන්දන - ලෙසින් හසිනි නොලසා........
> මෙවන් රුසිරු නුඹෙ දුල්වන - කුසුම් සරගෙ ඔද සොල්වන-
> විඳින්ට රති සැප කල් වන - වරෙන් පියඹ විගසා........

**Barbara Stoler Miller** විසින් ඉංග්‍රීසියට නගන ලද්දේ මෙසේ ය.

> **I do indeed speak without bias**
> **This is acknowledged as**
> **truth among men.**
> **Nothing enthralls us like**
> **an ample-hipped woman**
> **Nothing else cause such pain.**

***සිංහළට නැගුවහොත් එය මෙසේය.***

> ඇත්තෙන් මම කියම් කිසි පැත්තක් නොගෙන
> සැබවකි මෙය පිරිමි සැම පිළිගෙන තිබෙන
> ළඳකගෙ පුළුලුකුල වැනි සිත වසඟ වන
> නැත අන් දෙයක් - එලෙසම වේදනා දෙන

සිංහළ කවීන් ගැන කතා කළහොත් ශාංගාර රසයෙන් පිරිපුන් කවි ලිවීමට උපන් හපන්කමක් දැක්වූ කවීන් අතර මාතර යුගයට අයත් බරණ ගණිතාචාර්ය කිවිවරයා හැඳින්විය හැකිය. **සාදා** යනු ඔහුට තවත් නමකි. ඔහුගේ කවි එළිවැට හා රිද්මය අතින් ද උපමාරූපක අතින් ද විශිෂ්ටය. ඔහු තම සමකාලීනයන් අභිබවා යයි. එසේ ම ඔහු වස්කවි ලිවීමට ද හපනෙකු ව සිටි බවද ප්‍රකට ය.

බරණගණිතාචාර්ය වරක් කතරගම දෙවියන්ටද වස් කවිලියා ශාප කළ බවත් ඉන් ඔහුට ඉතා තදබල කුෂ්ට රෝගයක් වැළඳුණු බවත් ඊට ප්‍රතිකර්ම හැටියට ඔහු කතරගම දෙවියන් වර්ණනා කරමින් **නීලකොබෝ සංදේශය** රචනා කළ බවත් ඉන් ඔහුගේ රෝගය සුවවූ බවත් පැරණි පොත පතේ සඳහන් වෙයි.

බරණ ගණිතාචාර්ය දිනක් උදෑසන ගමනක් යන විට කිරින්දේ සිට ආ රූබර තරුණියක් දැක ශබ්ද රසය, අර්ථ රසය උතුරායන ශාංගාර රසයෙන් පිරිපුන් මෙහි ඉහත දක්වා ඇති රසාලිප්ත කවි දෙක හිටිවනම කීවේ ය.

මේ කවි පෙළ කියවන පාඨක ඔබගේ පහසුව පිණිස සමහර වචන වල තේරුම මෙසේ පහත දක්වමු.

(සුරින්ද - ශක්‍රයා,) (රතින්ද -රතී යනු අනංගයාගේ රූමත් බිරිඳයි) (තදින් තකට දිම් තොන් - යනු බෙර පදයකි.)
(පෙදෙන් නටන - පදයට අනුව නටන)
(තිසර පැටියන් - හංස පැටවි )
(සිරි කල් - ශ්‍රියා කාන්තාව)
(නුවන් යුග - ඇස් දෙක)
ලෙවන් අදර - ආලේප කළ තොල්
(දසන් පෙළ - දත් පෙළ)
(පෙදින් පෙදට - පදයෙන් පදයට)
(සළෙලු - සල්ලාලයින්)
(හසිනි - සිනහවෙන්)
(දුල්වන -බැබළෙන)
(කුසුම්සර - අනංගයා)

මගදී දුටු මේ තරුණිය වනාහි ශක්‍රයාගේ දිව්‍යාංගනාවක් බර නිසා බිමට ආවා වාගේයයි කියන කවියා ඇයගේ යොවුන් අහපසහ ඉතා ආසක්ත ලෙස වර්ණනා කරයි. මේ තරුණිය හා තමාට කම්සැප විඳින්නට සළස්වා දෙන කෙනෙකුට තමා මෙතෙක් හම්බ කර ඇති ධනය සියල්ලම දෙන බවත් ඔහු පවසයි. ඇයගේ රූපශ්‍රීය දැක අනංගයාගේ බිරිඳට පවා ඉරිසියා සිතෙන බවක් කියන කවියා රති සැප විඳින්නට කාලය පැමිණ ඇති බැවින් තවත් කල් නොයවා වහා වරෙන්නැයි ඇයට ආයාචනා කරයි.

මේ කවිදෙක මා මෙතෙක් කියවා ඇති ශාංගාරාත්මක පද්‍ය අතුරින් මුල් තැන්හි තබන්නේ මෙහි ගැප්ව ඇති කාව්‍යාලංකාරය, රිද්මය සහ සජීවී ගුණය නිසා ය. මෙවැනි පද්‍ය සැබැවින්ම ලොව දුර්ලභය.

♦ *දයා ආනන්ද*

# දරුවෙකු බිහිකළ 70 වියැති කත

# Woman 70 gives birth to a child

A 70-year-old woman in India has given birth to a baby girl after having IVF treatment.

Rajo Devi and her husband Bala Ram had been trying for a child during the 50 years they've been married.

It was only when neighbours told them about IVF treatment they realised they still had a chance and went to a fertility centre in nearby Hissar town in the northern state of Haryana.

Doctors delivered the child by caesarian section, and the proud parents are now looking forward to a party when they return to their village, Alewa.

Over 20,000 babies have been born worldwide using IVF which was discovered in England by two doctors in 1978.

When asked if, at their age, they would be able to look after a newborn daughter, the couple replied:

" Of course, we will take care of her very well. There will be no problem."



*Rajo Devi, her husband Bala Ram and the newly-born*

*රාජෝ දේවි සහ ඇයගේ සැමියා බාල් රාම් ලැබූ දියණිය සමග*

**ඉ**න්දියාවේ හරියානා ප්‍රාන්තයේ **70** හැවිරිදි කාන්තාවක් මේ ළඟදී දරුවෙකු ප්‍රසූත කළා ය. **රාජෝ දේවී** නම්වූ ඇය දරුවෙකු වැදූ ලොව වයස් ගතම කාන්තාව ලෙස දැන් සැලකේ. ඇය ද ඇයගේ සැමියා වන බාල්රාම් ද විවාහ වී වසර 50 ක් තිස්සේ දරුවෙකු ලැබීමේ අපේක්ෂාවෙන් සිටියද එය හරි ගියේ නැත. **IVF** නමැති කෘතිම ලෙස ගැබ්ගැන්වීම පිළිබඳව ඔවුන්ට මෑතකදී අසල්වැසියෙකුගෙන් දැනගන්නට ලැබී දෙදෙන හරියානාහි වෛද්‍ය මධ්‍යස්ථානයට ගියෝ ය. සියල්ල එහි සිදුවිය.

සිසේරියන් සැත්කමකින් වෛද්‍යවරු දරුවා බිහි කළහ. දරුවා දියණියකි. දෙමාපියන් වයස්ගත නිසා දියණියගේ අනාගතය කෙබඳු වේදැයි ඇසූ ප්‍රශ්නයට ඔවුන් දුන් පිළිතුර නම්:

" කිසි ප්‍රශ්නයක් නෑ.... අපි ඇය හොඳින් බලාගන්නවා යන්නයි...."

## What is IVF?

**IVF** is an acronym for **in vitro fertilization** ('in vitro' meaning 'in glass' ). Simply put **IVF** is adding a man's sperm to his female partners eggs in the laboratory to produce embryos. In vitro fertilization is an option for many couples who cannot conceive through conventional therapies. These embryos are put back into the female partner's uterus (womb) after 3 to 5 days of being in the incubator, hopefully they will then grow into a baby. The reasons **IVF** is done include - poor sperm quality and/or quantity, obstructions between the egg and sperm, ovulation problems, and sperm-egg interaction problems. These problems can prevent couples having a baby naturally, and **IVF** helps to solve this.

# Why geriatric mothers are bad for baby

**by Dr Miriam Stoppard - London - Daily Mirror**

The news this week that Mrs Rajo Devi has given birth to a baby girl at the age of 70 filled me with horror. She and her husband had longed for a baby all their married lives and were delighted to put an end to gossip they 'd endured for years - childlessness is a social stigma in India, where they live.

But is this really any reason for having a child ? To me it sounds like the ultimate in selfishness. We're becoming used to having anything we want at any time. But a child isn't a commodity.

The PC approach to infertility is that every woman has the right to bear a child but, to my mind, pregnancy and birth are unnatural and foolhardy for an old woman with a frail and ageing body. No woman was designed to have a baby at 70. But, perhaps more importantly, it's a contravention of a child's right to grow up with its parents - the chances of the child being orphaned before adulthood are high.

Just because the technology is there doesn't mean we should use it willy nilly. I believe doctors and fertility experts should exercise judg ment about not only the fitness of the mother's body but also the wellbeing of a baby born to ageing parents.

# වයස්ගත මව්වරුන් ළදරුවාට නරක ඇයි?

***වෛද්‍ය මිරියම් ස්ටොපාර්ඩ් පැහැදිලි කරයි***

**ඉ**න්දියාවේ 70 වියැති කාන්තාවක් බිළිඳියක ප්‍රසූත කළ බව ඇසූ මා සිත බියෙන් ඇළලුණි. දරුවෙකු නැතිව වසර ගණනාවක් සිටි ඇයත්, ඇයගේ සැමියාත් ඉන් අප්‍රමාණ සතුටු වන්නේ ඒ රටේ වඳභාවය සමාජයේ පිළිකුලෙන් සලකන නිසාය.

නමුත් දරුවෙකු ලබන්නේ ඒ සඳහාම පමණක්ද? මට නම් මෙය මහා ආත්මාර්ථකාමීකමක් ලෙස වැටහේ. අප ඕනෑම දෙයක් ඕනෑම වෙලාවක ලබාගන්නට පුරුදු වී ඇත. එහෙත් දරුවෙකු යනු භාණ්ඩයක් නොවේ.

වඳ භාවය තිබුණත් නැතත් හැම ගැහැණියකටම දරුවෙකු වැදීමේ අයිතියක් ඇතැයි යන්න සමහරුන්ගේ මතය වුනත් ඉතා වයස්ගත දුර්වල වී ගිය සිරුරක් ඇති ගැහැණියක් සඳහා නම් එය ඉතා අස්වාභාවික වන්නා සේම එය මෝඩ නිර්භීතකමකි. කිසිම ගැහැනියක් වයස 70 දී දරුවෙකු ලබන්නට සොබාදහම සැලසුම් කර නැත. මෙහිදී වඩා වැදගත් වශයෙන් සැලකිය යුත්තේ දෙමාපියන් ළඟ හැදෙන්නට දරුවෙකුට ඇති අයිතිය උල්ලංඝණය කිරීමක් මේ නිසා වන බවයි. එසේම මෙහිදී දරුවා සිය ළමා කාලයේ දී ම දෙමාපියන් නැති අනාථයෙකු වීමේ අවදානම ද ඉතා වැඩි ය.

අද නවීන තාක්ෂණය අප ඉදිරියේ තිබෙන පළියටම එය හිතුවක්කාර ලෙස යෙදිය යුතු නොවේ. වෛද්‍යවරුන්ද, ගැබ්ගන්වන විශේෂඥයින්ද දරුප්‍රසූතිය අපේක්ෂා කරන මවකගේ ශාරීරික ශක්‍යතාව පමණක් නොව ඒ බිහිවන දරුවාගේ අනාගත ශුභ සාධනය ගැන ද සිතිය යුතුයයි මම විශ්වාස කරමි.